# දකුණු ආසියාව තුළ ලිංගික ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමට කළ හැක්කේ කුමක්ද?

කාන්තාවන් හට මහමඟ හෝ තම නිවස තුළ ආරක්ෂාකාරී වටපිටාවක් නොමැති වූ විට, ඔවුන්ට ඉදිරියට යාමට ඇති ඉඩකඩ අවම වේ. මීට ඔවුන්ගේ ආර්ථික දියුණුව ද ඇතුළත් වේ. එවිට රටෙහි සංවර්ධනයට සහ දියුණුවට ද එය බාධා කරයි. පසුගිය දෙසැම්බර් මාසයේ දී නවදිල්ලි නගරයේ දී අමානුෂික ලෙස තරුණ කාන්තාවක කිහිපදෙනෙකු විසින් දූෂණය කොට ඝාතනයට කිරීම වැනි මෑතදී ඇතිවූ සිද්ධී හේතුවෙන් ප්‍රසිද්ධ සහ පෞද්ගලික ස්ථාන වලදී කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට මුහුණ දීමට සිදුවන ලිංගික අතවර සහ අනෙකුත් ලිංගික ප්‍රචණ්ඩත්වයන් පිළිබඳව විශාල අවධානයක් යොමුවිය.

අප්‍රේල් මාසයේ දී පැවැත්වීමට නියමිත ලෝකු බැංකු රැස්වීම් වලදී පවත්වනු ලබන කමිටු රැස්වීමක දී දකුණු ආසියාවේ විශේෂඥයෝ මේ පිළිබඳව සාකච්ඡා කරනු ඇත. මෙම සාකච්ඡාවන් පිළිබඳ දැනුවත් කිරීමට දකුණු ආසියාව තුළ වයස අවුරුදු 18-25 ත් අතර තරුණ පිරිස් සඳහා පවත්වන තරගයක් වෙනුවෙන් අනුග්‍රාහකත්වය දැරීමට ලෝක බැංකුව සූදානම් වේ. **ඔබේ රටෙන් ලිංගික ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමට කුමක් සිදුකළ යුතුද?** යන ප්‍රශ්නයට ඔබ තුළ ඇති හොඳම අදහස් ලබා ගැනීමට අපට අවශ්‍යයි.

මේ සඳහා පිළිතුරු යොමුකළ හැක්කේ කෙටි පණිවුඩ මගිනි. වචන අතර ඉඩ සහිතව ඔබගේ කෙටි පණිවුඩය අකුරු 140 කට පමණ සීමාවිය යුතුය. ඔබගේ පිළිතුරු 94777256076 යන අංකයට හෝ nogenderviolence@worldbank.org යන ඊමේල් ලිපිනයට හෝ ලෝක බැංකුව, පළමු මහළ, DFCC ගොඩනැගිල්ල, 73/5, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව යන ලිපිනයට හෝ යොමු කළ හැක.

කෙටි පණිවුඩ ඉදිරිපත් කළ හැක්කේ ඉංග්‍රීසි භාෂාවෙන් හෝ තම රටෙහි ජාතික භාෂාවන්ගෙන් පමණි. ඔබගේ සම්පූර්ණ නම, දුරකථන අංකය, ඊමේල් ලිපිනය ද ඒ සමග එවිය යුතු වේ.

සියළු පිළිතුරු **මාර්තු 15 වන සිකුරාදා ග්‍රිනිච් මධ්‍ය වේලාවෙන් මධ්‍යම රාත්‍රී 12 ට පෙර** එවිය යුතු වේ. පිළිතුරු ලෝක බැංකුව විශේෂඥයන් මණ්ඩලයක් විසින් විනිශ්චයට ලක් කරන අතර, ජයග්‍රාහකයන් දැනුම් දීම ලබන අප්‍රේල් මස ලෝක බැංකු රැස්වීම් වාරයට පෙර සිදු කෙරේ.

**ත්‍යාග ඃ**

පළමු ජයග්‍රාහකයන් දස දෙනා හට වීඩියෝ කැමරාවක් ත්‍යාග ලෙස හිමිවේ. ඊට අමතරව, ජයග්‍රාහී කෙටි පණිවුඩ වොෂින්ටන් හි පැවැත්වෙන ලෝක බැංකු රැස්වීම් අතරතුර ප්‍රදර්ශනය කරනු ඇති අතර, ලෝක බැංකු වෙබ් අඩවියෙහි සහ අනෙකුත් මාධ්‍යයන් තුළ ද ඒවා පළ කරනු ඇත.

**විස්තර ඃ**

මෙම තරග විවෘත වනුයේ පහත දැක්වෙන රටවල සිටින **2013 මාර්තු 15** වන දිනට වයස අවුරුදු 18-25 අතර තරුණ තරුණියන්ටය. එම රටවල් නම් ඇෆ්ගනිස්තානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පාකිස්ථානය හෝ ශ්‍රී ලංකාව. ලෝක බැංකු සමූහය තුළ සේවක මණ්ඩලය සහ එහි උපදේශකයන්ට මෙන්ම ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ට මෙම තරගය විවෘත නොවේ. එවනු ලබන සියලු පිළිතුරු/අදහස් ලෝක බැංකු සමූහයෙහි අයිතියක් බවට පත්වන අතර, ඕනෑම ආකාරයකින් ඒවා නැවත භාවිතා කිරීම හෝ පළ කිරීමට අයිතිය බැංකුව සතු වේ. අපේක්ෂා කරන මට්ටමේ පිළිතුරු/අදහස් නොලැබුණු විටක දී ලබාදෙන විනිශ්චය මත ත්‍යාග 10කට අඩුවෙන් හෝ ත්‍යාග ලබානොදීමට හෝ අයිතිය ලෝකු බැංකුව සතු වේ.